සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය / தரம் / Grade	කාලය / நேரம் / Time
11 ශ්‍රේණිය	පැය 03යි

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I -II

නම / பெயர் / Name ..... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. .....

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි **අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛතාවය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.**

උපදෙස්:

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරු වලින් **නිවැරදි** හෝ **වඩාත් ගැළපෙන** හෝ පිළිතුර තෝරා ගන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

- පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් අංක 01 සිට 5 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
  සඳළුලිය මහා විද්‍යාලයේ පාසැල් සමූපකාර සමිතිය, ආදි ශිෂ්‍ය සංගමය සහ පාසල් කළමනාකරණ කමිටු ගුරුභවතුන්ගේ ඉල්ලීමකට අනුව, ප්‍රදේශයේ දානපති ව්‍යාපාරිකයෙකු වන චාල්ස් මහතා විසින් හේන් ගෝවීන්ගේ මිලට ගත් නැවුම් ධාන්‍ය යොදා,ඔහුගේ ව්‍යාපාරය මගින් සකසන 'හෙල්ත් බට්ටි' නැමැති බිස්කට් පාසලට පරිත්‍යාග කරන අතර මෙම පෝෂ්‍යදායී ධාන්ය බිස්කට්වලට සිසුන් වැඩි රුචිකත්වයක් දක්වයි.

1. සඳළුලිය මහා විද්‍යාලය විසින් සපුරාලනු ලබන මිනිස් අවශ්‍යතාව කුමක්ද?
   (1) සෞඛ්‍ය (2) ආහාර (3) අධ්‍යාපන (4) සන්නිවේදනය

2. සඳළුලිය මහා විද්‍යාලයේ බාහිර පරිසර සාධකයක් සඳහා නිදසුනක් වන්නේ ,
   (1) පාසැලේ සිසුන් (2) පාසලේ ගුරුභවතුන්
   (3) විදුහල්පතිතුමා (4) හෙල්ත් බට්ටි ව්‍යාපාරය

3. ඉහත සිද්ධියේ ඇතුළත් රාජ්‍ය අංශයේ සංවිධානයක් වනුයේ,
   (1) සඳළුලිය මහා විද්‍යාලය යි. (2) හෙල්ත් බට්ටි ව්‍යාපාරය යි.
   (3) ආදි ශිෂ්‍ය සංගමය යි. (4) පාසැල් සමූපකාර සමිතිය යි.

4. ඉහත සිද්ධියෙහි ඇතුලත් පෝෂ්‍යදායී බිස්කට් සකස් කිරීමට භාවිත කළ ධාන්‍ය අයත්වන නිෂ්පාදන සාධකය කුමක්ද?
   (1) භූමිය (2) ශ්‍රමය (3) ප්‍රාග්ධනය (4) ව්‍යවසායකත්වය

5. ඉහත සිද්ධිය ඇතුළත් හෙල්ත් බට්ටි ව්‍යාපාරය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
   (1) මෙම ව්‍යාපාරයට නීතිමය පුද්ගලභාවයක් ඇත.
   (2) මෙම ව්‍යාපාරයේ හිමිකරු වන චාල්ස් මහතාගේ වගකීම සීමිත වේ.
   (3) මෙම ව්‍යාපාරය ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාරයකි.
   (4) මෙම ව්‍යාපාරයේ නාමය ලියාපදිංචි කිරීම අනිවාර්ය වේ.

Past Papers Wiki

6. සීමාසහිත කොටගොඩ විවිධ සේවා සමූපකාර සමිතිය [1]..... අංශයේ [2]..... ව්‍යාපාර සංවිධානයකි.
ඉහත 1 හා 2 ස්ථානවලට අදාළ නිවැරදි යෙදුම් පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) පෞද්ගලික, ලාභ අරමුණු කරගත් (2) පෞද්ගලික, ලාභ අරමුණු කර නොගත්
(3) පොදු, ලාභ අරමුණු කරගත් (4) පොදු, ලාභ අරමුණු කර නොගත්

7. පහත ප්‍රකාශ ඇසුරින් සිල්ලර වෙළඳාමක් දැක්වෙන ප්‍රකාශය තෝරන්න.
(1) දොන් කරෝලිස් ලී බඩු වෙළෙන්දෝ විසින් කළුවර අල්මාරියක් මොරටු ලීබඩු වෙලඳ සැලකට විකිණීම.
(2) ආපනශාලාවකට කේක් 3Kg ක් මිලට ගැනීම.
(3) බීරළු රේන්දවලින් නිර්මාණය කළ ඇඳුමක් ලක්සලට විකිණීම
(4) රන්තරු ක්‍රීඩා සමාජය විසින් වාර්ෂිකව පවත්වන දන්සැල සඳහා සහල් 250Kg ක් විකිණීම.

- හික්කඩුව ලංකා බැංකුවේ ජංගම ගිණුමක් හිමි රසික කණ්ඩම්බි රු. 100 000 ක චෙක්පතක් බද්දේගම ලංකා බැංකුවේ ජංගම ගිණුමක් හිමි මිහිරි පෙරේරාට නිකුත් කරන ලදි.

8. ඉහත සිද්ධියට අදාල ව අණකරු වනුයේ,
(1) මිහිරි පෙරේරා (2) හික්කඩුව ලංකා බැංකුව
(3) රසික කණ්ඩම්බි (4) බද්දේගම ලංකා බැංකුව

9. පහත දැක්වෙන්නේ චෙක්පතක් සම්බන්ධ ප්‍රකාශ දෙකකි.
A - චෙක්පතට වැඩි ආරක්ෂාවක් ලබා ගැනීම සඳහා චෙක්පත් රේඛනය කරයි.
B - සෑම වාණිජ බැංකුවක් විසින් නිකුත් කරන චෙක්පත්වල වුම්භක තීන්ත අක්ෂර හැඳුනුම් තීරුවක් පවතී.
ඉහත ප්‍රකාශ සම්බන්ධ නිවැරදි පිළිතුර තෝරන්න.
(1) A පමණක් සත්‍ය වේ. (2) B පමණක් සත්‍ය වේ.
(2) A හා B ප්‍රකාශ දෙකම සත්‍ය වේ. (4) A හා B ප්‍රකාශ දෙකම අසත්‍ය වේ.

10. **අධිවේගී ධාවනයට සුපිරි සුපෝඛහෝගී බස්රථ 100 ක් මෙට්‍රෝ බස් සමාගම මිලට ගනී.** මෙම ප්‍රකාශය තුළ ගම්‍ය වන සුඛෝපභෝගී බස්රථ හා අධිවේගී මාර්ගය අයත්වන ප්‍රවාහන මූලිකාංග පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) මාර්ගය හා පර්යන්තය (2) මාධ්‍ය හා බලය
(3) බලය හා මාර්ගය (4) මාධ්‍ය හා මාර්ගය

11. ජීවිත රක්ෂණය සම්බන්ධව බලනොපාන මූලධර්මය තෝරන්න.
(1) උපරිම විශ්වාසය (2) රක්ෂණ හිමිකම
(2) හානිපූර්ණය (4) දායකත්වය

12. විකුණුම් කළමනාකරු විසින් පාරිභෝගිකයෙකු වන අංජුල වෙත නිෂ්පාදනයේ විශේෂ වට්ටම් සහිතව ඇණවුම් කිරීමේ අවසන් දිනය දන්වා ඊමේල් පණිවිඩයක් යැවීම.
ඉහත ප්‍රකාශයේ ඇතුළත් සන්නිවේදනයේ මූලිකාංග වන්නේ,
(1) යවන්නා, ලබන්නා හා පණිවුඩයයි. (2) පණිවුඩය, ප්‍රතිචාරය හා ප්‍රතිපෝෂණයයි.
(3) මාධ්‍ය, පණිවුඩය හා ප්‍රතිපෝෂණයයි. (4) යවන්නා, ලබන්නා හා ප්‍රතිචාරයයි.

13. ගාල්ල සංස්කෘතික නාට්‍ය උළෙලේ සංවිධායක කමිටුව සිදු කළ ක්‍රියාකාරකම් කිහිපයක් පහත දැක්වේ.
A – වාර්ෂික සංස්කෘතික නාට්‍ය උළෙල ඔක්තෝම්බර් 13 පැවැත්වීමට තීරණය කිරීම
B - නාට්‍ය කණ්ඩායමේ උදාසීන බව නැති කිරීමට දිනපතා පුහුණුවීම් කටයුතු වල යෙදවීම.
C - සංස්කෘතික නාට්‍ය විනිශ්චය සඳහා විනිශ්චය මණ්ඩලයක් කෝරා ගැනීම.
D - සැලසුම් කළ කාලරාමුව අනුව නාට්‍ය කටයුතු නිම කිරීම.
ඉහත ක්‍රියාකරකම අතුරෙන් කළමනාකරණ ක්‍රියාවලියේ සැලසුම්කරණය හා සංවිධානකරණය පිළිවෙළින් දැක්වෙන්නේ,
(1) A හා B මඟිනි (2) A හා C මඟිනි (3) B හා C මඟිනි (4) A හා D මඟිනි

- කුඩා දරුවන්ට ගුණාත්මක රසකැවිලි අළෙවිකරන **රස මැදුර** ව්‍යාපාරයට නුදුරින්, රසකැවිලි වර්ග තරමක් අඩු මිලකට සහ නවීන ඇසුරුම්වලින් අලවි කරන **මිහිරි ස්වීට්** නමින් නව වෙළඳසැලක් ආරම්භ කිරීම නිසා රස මැදුර ව්‍යාපාරය ගැටළුවකට මුහුණ දී සිටී. මේ නිසා රස මැදුරේ අයිතිකරු පෞද්ගලික විකිණුම් වැඩසටහනක් යටතේ පක්ෂපාතී පාරිභෝගික කාඩ්පත් විශේෂයක් (loyality card program) හඳුන්වා දුන්නේය.

14. රස මැදුර ව්‍යාපාරයට බලපාන ඉලක්ක වෙළඳපොළ කුමක් ද?
(1) කුඩා දරුවන් (2) සේවකයේ සේවකයන්
(3) තරහකරුවන් (4) කළමනාකරුවන්

15. 'රස මැදුර' ව්‍යාපාරයේ අළෙවිකරණ මිශ්‍රයේ විචල්‍යයක් වන ප්‍රවර්ධනයට නිදසුනක් වන්නේ?
(1) පහසු ගෙවීමේ ක්‍රමයක් හඳුන්වා දීම.
(2) 'පක්ෂපාතී පාරිභෝගික කාඩ්පත් විශේෂයක්' (loyality card program)
(3) මිහිරි ස්වීට්ස් නමින් නව වෙලඳසැලක් ආරම්භ කිරීම.
(4) රසකැවිලි නිෂ්පාදිත අලෙවි කිරීම.

16. ජයන්ත සතුව තිබූ රු. 400 000 ක මුදල සීමාසහිත පොදු සමාගමක සාමාන්‍ය කොටස්වල ආයෝජනය කළේය. 2024 වර්ෂයේ එම සමාගම ඉපැයූ ලාභයෙන් රු.22 000 ක් ඔහුට හිමිවිය. පසුව සියළු කොටස් රු.550 000 කට විකුනන ලදි. මෙම ආයෝජනයෙන් ජයන්ත උපයාගත් ප්‍රතිලාභ හැඳින්වෙන යෙදුම් දැක්වෙන පිළිතුරු තෝරන්න.
(1) පොළිය සහ ප්‍රාග්ධන ලාභ (2) ලාභාංශ සහ ප්‍රාග්ධන ලාභ
(3) ලාභාංශ සහ පොළී ආදායම් (4) ලාභ සහ ප්‍රාග්ධන ලාභ

17. ව්‍යාපාරයක ගනුදෙනුවක් හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ගනුදෙනුවක වටිනාකම ගනුදෙනුව සිදුවන අවස්ථාවේදීම බෙරුම් කළ යුතුය.
(2) ගනුදෙනු ලෙස සැලකිල්ලට ගනු ලබන්නේ අත්පිට මුදලින් පමණක් සිදුවන ගනුදෙනු පමණි.
(3) ව්‍යාපාරයක් හා වෙනත් පාර්ශව අතර සිදුවන සම්පත් හුවමාරු වීම ගනුදෙනුව කි.
(4) ගනුදෙනු තුළින් බිහිවන්නේ වත්කම්, වගකීම්, හිමිකම් පමණි.

18. පහත දැක්වෙන වත්කම් ගිණුම් අතුරින් ජංගම වත්කම් පමණක් ඇතුලත් පිළිතුර තෝරන්න.
A - මුදල් **B** - රථ වාහන **C** - ලී බඩු
D - ණයගැතියෝ **E** - බැංකු ශේෂය F - කලින් ගෙවූ වියදම්
(1) A, B,D, E (2) D,C,E, F
(3) A, D, E, F (4) A,C, E, F

19. ව්‍යාපාරයක වත්කම් වලට පමණක් බලපාන ගනුදෙනුව කුමක්ද ?
(1) රු. 31 000 ක් ණය හිමියන්ට ගෙවීම.
(2) රු. 15 000 ක තොගයක් ණයට විකිණීම.
(3) රු. 20 000 ක බඩු තොගයක් රු 25 000 කට විකිණීම.
(4) රු. 50 000 ක් අයිතිකරු විසින් අමතර ප්‍රාග්ධනය ලෙස යෙදවීම.

- පහත සිද්ධිය ඇසුරින් **20** හා **21** ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
සාලින්දගේ ව්‍යාපාරයේ 2025 පෙබරවාරි මාසය තුළ සිදු වූ ගනුදෙනු කිහිපයක් පහත දැක්වේ.
A – රු. 35 000 ක භාණ්ඩ තොගයක් මිල දී ගැනීම.
B – රු. 20 000 ක් පිරිවැය වූ භාණ්ඩ තොගයක් රු. 28 000 කට විකිණීම.
C – අයිතිකරු විසින් ව්‍යාපාරයේ දුරකථන බිල රු.5 000 ක් පෞද්ගලික මුදලින් ගෙවීම.
D – රු. 13 000 ක් ණය හිමියන්ට ගෙවීම.

20. සාලින්දගේ ව්‍යාපාරයේ හිමිකම වෙනස් වීම කෙරෙහි බලපාන ගනුදෙනුවක් වන්නේ,
(1) B පමණි. (2) A හා B පමණි.
(3) B, C හා D පමණි. (4) B හා C පමණි.

21. සාලින්දගේ ව්‍යාපාරයේ 2025 පෙබරවාරි 28 දිනට මුළු වගකීම් වල වටිනාකම රු 54 000 ක් වූයේ නම් ඉහත ගනුදෙනු වලට පෙර මුළු වගකීම් වල වටිනාකම කොපමණ ද?
(1) රු. 33 000 කි. (2) රු. 67 000 කි.
(3) රු. 32 000 කි. (4) රු. 41 000 කි.

22. ලී බඩු ව්‍යාපාරයක යන්ත්‍රෝපකරණවල අගය(1)..... වන අතර ලී බඩු(2)..... වේ.
ඉහත **1** හා **2** ස්ථාන වලට අදාළ නිවැරදි යෙදුම් පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) වත්කම්, වගකීම්
(2) ජංගම වත්කම්, ජංගම නොවන වගකීම්
(3) වත්කම්, හිමිකම්
(4) ජංගම නොවන වත්කම්, ජංගම වත්කම්

23. නුවන්ගේ ව්‍යාපාරයේ සිදු වූ ගනුදෙනු කිහිපයක් පහත දැක්වේ.
A – රු. 8 000 ක් වූ විදුලි බිල ගෙවීම.
B – රු. 10 000 ක් ණය හිමියන්ට ගෙවීම.
C – රු. 30 000 ක කාර්යාල උපකරණ මිලට ගැනීම
D – රු. 100 000 ක බැංකු ණයක් ලබා ගැනීම.
ඉහත ගනුදෙනු අතුරින් ගෙවීම් වවුචරයේ මූලාශ්‍ර ලේඛනය ලෙස භාවිතා කරන ගනුදෙනු මොනවා ද?
(1) A, C හා D
(2) A හා B
(3) B, C හා D
(4) A, B හා C

24. රු. 44 000 ක භාණ්ඩ ණයට විකිණීමට අදාළ නිවැරදි ද්විත්ව සටහන තෝරන්න.
(1) ණය ගැනි ගිණුම හර 44 000
විකුණුම් ගිණුම බැර 44 000
(2) ණයහිමි ගිණුම හර 44000
විකුණුම් ගිණුම බැර 44000
(3) මුදල් ගිණුම හර 44 000
ණයගැනි ගිණුම බැර 44 000
(4) මුදල් ගිණුම හර 44 000
විකුණුම් ගිණුම බැර 44 000

25. පසිඳුගේ ව්‍යාපාරයේ සුළු මුදල් අග්‍රිමය රු 15 000 කි. අප්‍රේල් මාසයේ සිට අග්‍රිමය රු 2 000 කින් වැඩි කිරීමට තීරණය කරන ලදි. මාර්තු මාසයේ සුළු මුදල් වියදම් වල එකතුව රු.13 100 ක් වූයේ නම් අප්‍රේල් 1 දිනට ප්‍රතිපූර්ණය කළ යුතු මුදල කොපමණ ද?
(1) රු. 13 100 කි.
(2) රු. 15 100 කි.
(3) රු. 15 000 කි.
(4) රු. 17 000 කි.

26. බැංකු ගිණුමේ ශේෂය හා බැංකු ප්‍රකාශනයේ ශේෂය සමාන නොවන අවස්ථාවක බැංකු ගිණුමේ ශේෂය සංශෝධනය කිරීමේ දී යොදා ගන්නා අයිතම ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) නිශ්කාශනය නොවූ චෙක්, සෘජු ප්‍රේෂණ, ස්ථාවර නියෝග මත ගෙවීම
(2) ගෙවීම සඳහා බැංකුවට ඉදිරිපත් නොවූ චෙක්, බැංකු ගාස්තු
(3) සෘජු ප්‍රේෂණ, බැංකුව අය කළ ගාස්තු, ස්ථාවර නියෝග මත ගෙවීම
(4) බැංකුව අයකළ ගාස්තු ගෙවීම සඳහා බැංකුවට ඉදිරිපත් නොවූ චෙක්, ණයගැනි ප්‍රේෂණ

27. ණය ගැනියෙකුගෙන් ලද රු. 30 000 ක චෙක්පත එදිනම බැංකුවේ තැන්පත් කිරීමට අදාළ ද්විත්ව සටහන වන්නේ,
(1) මුදල් ගිණුම හර රු. 30 000
ණයගැනි ගිණුම බැර රු. 30 000
(2) බැංකු ගිණුම හර රු. 30 000
මුදල් ගිණුම බැර රු. 30 000
(3) බැංකු ගිණුම හර රු. 30 000
ණයගැනි ගිණුම බැර රු. 30 000
(4) බැංකු ගිණුම හර රු. 30 000
විකිණුම් ගිණුම බැර රු. 30 000

28. කිසියම් ගිණුම්කරණ වරදක් නිවැරදි කිරීම සඳහා තබන ලද ද්විත්ව සටහන පහත දැක්වේ.
මුදල් ගිණුම හර රු. 21 000
විදුලි වියදම් ගිණුම බැර රු. 21 000
ඉහත සිදු වී ඇතැයි සිතිය හැකි වරද වන්නේ,
(1) විදුලි වියදම් රු. 21 000 දෙවරක් ගිණුම් වල සටහන් වීම.
(2) රු. 21 000 විදුලි වියදම් ගෙවීම ගිණුම් පොත්වල සටහන් නොවීම.
(3) විදුලි වියදම් රු. 21 000 ශේෂ පිරික්සුමේ සටහන් කර නොතිබීම.
(4) රු. 21 000 විදුලි වියදම් මුදල් පොතේ පමණක් සටහන් වී තිබීම.

29. ශේෂ පිරික්සුමේ සමානත්වයට බලපෑමක් ඇති කරන වරද කුමක් ද?
(1) රු. 15 000 ක ගොඩනැගිලි කුලී ගෙවීම, ගොඩනැගිලි ගිණුමේ සටහන් කර නොතිබීම.
(2) රු. 50 000 විකිණුම් ගිණුම් වල දෙවරක් සටහන් වීම.
(3) රු. 25 000 ක වැටුප් ගෙවීම රු. 2 500 ක් ලෙස මුලාශ්‍ර ලේඛණයේ සටහන් වී තිබීම.
(4) කාර්යාල උපකරණ ගිණුම් ශේෂය රු. 200 000 ශේෂ පිරික්සුමේ බැර පැත්තේ සටහන් කර තිබීම.

30. සුමිතුරෝ සුහද සමිතියේ සාමාජික සංඛ්‍යාව 100 කි. එක් අයෙකුගේ මාසික සාමාජික ගාස්තුව රු.200.
2024 වර්ෂය සඳහා සාමාජිකයින් 15 දෙනෙකු සාමාජික මුදල් ගෙවා නොමැත.
2025 වර්ෂයේ ආදායම් ප්‍රකාශයේ ඇතුළත් කළ යුතු සාමාජික මුදල වන්නේ,
(1) රු. 17 000 කි. (2) රු. 20 000 කි. (3) රු. 204 000 කි. (4) රු. 240 000 කි.

31. ප්‍රගති ක්‍රීඩා සමාජයේ ලැබීම් හා ගෙවීම් ගිණුමේ ඇතුළත් වන, ආදායම් ප්‍රකාශනයේ ඇතුළත් නොවන අයිතම සහිත පිළිතුර තෝරන්න.
(1) ක්‍රීඩා උපකරණ මිලදී ගැනීම, ඉදිරි වර්ෂය සඳහා ලද සාමාජික මුදල්
(2) ක්‍රීඩා උපකරණ ක්ෂය, ක්‍රීඩා උපකරණ මිලදී ගැනීම
(3) උපචිත ගොඩනැගිලි කුලී, ක්‍රීඩා උපකරණ මිලදී ගැනීම.
(4) පරිත්‍යාග ලැබීම්, වාර්ෂික සාමාජික මුදල්

32. පහත වගුවෙහි X තීරුවේ ඇහළුම් නිෂ්පාදන ආයතනයකට අදාළ වියදම් අයිතම කිහිපයක් ද Y තීරුවේ නිෂ්පාදන පිරිවැය මූලිකාංග කිහිපයක් ද දැක්වේ.

X	**Y**
1. ඇහළුම් ආයතනයේ ගොඩනැගිලි කුලිය	A වක්‍ර ශ්‍රමය
2. ඇඳුම් මෝස්තර නිර්මාණකරුගේ වැටුප	B ඍජු වෙනත් පිරිවැය
3. මුරකරු වැටුප	C ඍජු ශ්‍රම පිරිවැය
4. මහන මැෂින් ක්‍රියාකරුවන්ගේ වැටුප්	D වක්‍ර වෙනත් පිරිවැය

ඉහත X තීරුවේ සඳහන් වියදම් අයිතම Y තීරුවේ සඳහන් නිෂ්පාදන පිරිවැය මූලිකාංග සමඟ පිළිවෙලින් ගැලපූ විට නිවැරදි පිළිතුර වන්නේ,
(1) 1-D, 2-B, 3-A, 4-C (2) 1-A, 2-C, 3-D, 4-B
(3) 1-D, 2-A, 3-B, 4-C (4) 1-B, 2-D, 3-C, 4-D

33. ප්‍රාථමික පිරිවැය මූලිකාංග දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) ඍජු ද්‍රව්‍ය පිරිවැය + ඍජු ශ්‍රම පිරිවැය + පොදු කාර්ය පිරිවැය
(2) ඍජු ද්‍රව්‍ය පිරිවැය + ඍජු ශ්‍රම පිරිවැය + වක්‍ර වියදම්
(3) ඍජු ද්‍රව්‍ය පිරිවැය + ඍජු ශ්‍රම පිරිවැය + වෙනත් ඍජු වියදම්
(4) වක්‍ර ද්‍රව්‍ය පිරිවැය + වක්‍ර ශ්‍රමය + වක්‍ර වෙනත් වියදම්

- පහත සඳහන් තොරතුරු භාවිතයෙන් අංක **34** සිට **40** දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

කාවින්ද 2024.01.01 දින රු. 500 000 ක් ආයෝජනය කර ආරම්භ කළ ව්‍යාපාරයේ 2024.12.31 දිනෙන් අවසන් වර්ෂයට අදාළ තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

ආදායම්	රු.
විකුණුම්	500 000
ලද ගොඩනැගිලි කුලී.....	12 000
වියදම්	
බැංකු ණය පොලී	5 000
ප්‍රචාරණ වියදම්.....	2 000
විදුලි වියදම්	15 000
සේවක වේතන	20 000
වරිපනම් ගාස්තු	4 000
ණයට ගැනුම්	180 000
අත්පිට මුදලට ගැනුම්	100 000

PAST PAPERS WIKI

2024.12.31 දිනට ව්‍යාපාරයේ වත්කම් හා වගකීම් පහත දැක්වේ.

<u>වත්කම්</u>	රු.
ඉඩම් හා ගොඩනැගිලි	400 000
තොගය	15 000
කාර්යාල උපකරණ (පිරිවැයට)	20 000
ණය ගැතියෝ	18 000
ආයෝජන	155 000
මුදල් ශේෂය	30 000
<u>වගකීම්</u>	
ණය හිමියෝ	50 000
10% බැංකු ණය	80 000
උපචිත විදුලි ගාස්තු	8 000

අමතර තොරතුරු:

කාර්යාල උපකරණ 10% බැගින් වාර්ෂිකව ක්ෂය කළ යුතුය.

34. කාවින්දගේ ව්‍යාපාරයේ 2024.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විකුණුම් පිරිවැය
(1) රු. 205000 කි. (2) රු. 235000 කි.
(3) රු.240000 කි. (4) රු. 265000 කි.

35. කාවින්දගේ ව්‍යාපාරයේ 2024.12.31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ශුද්ධ ලාභය
(1) රු. 56000 කි. (2) රු. 67000 කි.
(3) රු. 188000 කි. (4) රු. 216000 කි.

36. කාවින්දගේ ව්‍යාපාරයේ 2024.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කළ ලාභ හෝ අලාභ ප්‍රකාශයෙන් දැක්වෙන පරිපාලන වියදම් වල එකතුව
(1) රු. 43000 කි. (2) රු. 49000 කි.
(3) රු. 51000 කි. (4) රු. 61000 කි.

37. කාවින්දගේ ව්‍යාපාරයේ ජංගම වත්කම් හා ජංගම වගකීම්වල වටිනාකම පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) රු. 63000, රු 61000 කි. (2) රු. 33000, රු.61000 කි.
(3) රු. 48000, රු.58000 කි. (4) රු. 63000, 53000 කි.

38. 2024.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වෙන ණය පොලී වටිනාකම
(1) රු. 8000 කි. (2) රු. 5000 කි.
(3) රු. 3000 කි. (4) රු. 13000 කි.

39. 2024.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වෙන ජංගම නොවන වත්කම් වල ධාරණ අගය
(1) රු. 18000 කි. (2) රු. 20000 කි.
(3) රු. 400000 කි. (4) රු. 418000 කි.

40. 2024.12.31 දිනට කාවින්දගේ ව්‍යාපාරයේ හිමිකම වන්නේ ?
(1) රු. 500000 කි. (2) රු. 600000 කි.
(3) රු. 688000 කි. (4) රු. 686000 කි.

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය / தரம் / Grade	11 ශ්‍රේණිය	වාහපාර හා ගිණුම්කරණ අධ්‍යයනය II	

නම / பெயர் / Name ..... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. .....

උපදෙස් -

පළමුවන ප්‍රශ්නය ඇතුළුව I කොටසින් ප්‍රශ්න දෙකක් ද II කොටසින් ප්‍රශ්න දෙකක් තෝරා ගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

- **පහත සිද්ධිය ඇසුරෙන් අංක (i) සිට (x) දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

අ.පොෂ සා.පෙළට පෙනී සිටීමෙන් පසුව සනුල් කාර්මික විද්‍යාලය මඟින් පැවැත් වූ නවීන තාක්ෂණය මුසු වූ වඩු කාර්මික ඩිප්ලෝමා පාඨමාලාව ක් හදාරන ලදි. ඉන් අනතුරුව, සිය පියාගෙන් ලද රු.500 000 ක මුදල යොදවා නිවසට යාබදව ඉදිකරන ලද තාවකාලික ගොඩනැගිල්ලක ගෘහ භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයක් **සනුල් ෆර්නිචර්** නමින් 2025.01.01 දින ආරම්භ කරන ලදි. ඔහුගේ සොහොයුරා විසින් දැව වර්ග සුමට කිරීම සඳහා අවශ්‍ය රු.60 000 ක් වටිනා යන්ත්‍රයක් මෙදිනම ඔහුට ලබා දෙන ලදි. 2025.01.01 දින 8% වාර්ෂික පොලියකට රු. 900 000 ක ණය මුදලක් ද ප්‍රාදේශීය සංවර්ධන බැංකුවෙන් ලබා ගන්නා ලදි.

නිර්මාණශීලී අදහස් ඇති සනුල් සෑම විටම නවීන මෝස්තර වලට අනුව ගෘහභාණ්ඩ නිපදවන නිසා අධික ඉල්ලුමක් පවති. මේ නිසා ඔහු, නගර මධ්‍යයේ ගෘහ භාණ්ඩ අළෙවි ප්‍රදර්ශනාගාරයක් ආරම්භ කිරීමට තීරණය කර ඇත. එසේම තාවකාලික ගොඩනැගිල්ල වෙනුවට රු.1 000 000 ක් වටිනා ස්ථිර ගොඩනැගිල්ලක් ද මිලදී ගෙන වඩු කාර්මිකයන් දෙදනෙකු ද බඳවා ගන්නා ලදි.

ගෘහභාණ්ඩ මිලෙන් අධික නිසා ගෙවීමේ ක්‍රමයට ලබා ගැනීමට පහසුකම් සලසා ඇත. එකවර මුදල් ගෙවන්නේ නම් 10% වට්ටම් ලබා දේ. ගෘහභාණ්ඩ පිළිබඳ ප්‍රචාරණය සඳහා පුවත්පත් හා අන්තර්ජාලය යොදාගෙන ඇත.

2025.01.31 දිනෙන් අවසන් මාසය සඳහා පහත සඳහන් ගනුදෙනු සිදු වී ඇත.

දැව අත්පිට ගැනුම්.....	180 000
ණයට ගැනුම්	90 000
ප්‍රවාහන වියදම්	25 000
සේවක වැටුප්	.120 000
ගෘහභාණ්ඩ අත්පිට විකුණුම්	350 000
විදුලිය	14 000
කුෂන් රෙදි	50 000
පොලිෂ් සහ ඇණ	85 000
වැලි කඩදාසි	10 000
ගෘහ භාණ්ඩ ණයට විකුණුම්	300 000

අමතර තොරතුරු

1. දැව සුමට කිරීමේ යන්ත්‍රය වාර්ෂිකව 5% බැගින් ක්ෂය කල යුතුය.
2. බැංකු ණය පොලිය 2025.01.31 දින වන විටත් ගෙවා නොනිබුණි.

1. i. (අ) සනුල් ෆර්නිචර් ව්‍යාපාරය මඟින් සපුරාලන වුවමනාව කුමක් ද?
(ආ) නිෂ්පාදනයේ ස්වභාවය අනුව මෙම ව්‍යාපාරය කුමන ව්‍යාපාරයක ට අයත් වේද?

ii. (අ) ඉහත සිද්ධියට අදාළ නිෂ්පාදන සාධක 02 ක් උදාහරණ සහිතව දක්වන්න.
(ආ) සනුල් ෆර්නිචර් ව්‍යාපාරයේ ඇල්මැති පාර්ශවයන් 02 ක් ඔවුන් ගේ අරමුණු සහිතව දක්වන්න.

iii. (අ) සනුල් ව්‍යාපාරය සතු ශක්තියක් හා අවස්ථාවක් දක්වන්න.
(ආ) ඉහත සිද්ධියේ සඳහන් සන්නිවේදන මාධ්‍ය 02 ක් උදාහරණ සහිතව දක්වන්න.

iv. (අ) සනුල් ෆර්නිචර් ව්‍යාපාරයේ කළමනාකරණ කාර්යයන් 02 ක් උදාහරණ සහිතව දක්වන්න.
(ආ) ඉහත සිද්ධියට අදාළ ව අලෙවිකරණ මිශ්‍රයේ කාර්යයන් 02 ක් උදාහරණ සහිතව දක්වන්න.

v. 2025.01.01 දිනට මෙම ව්‍යාපාරයේ මූලික ගිණුම්කරණ සමීකරණය දක්වන්න.

vi. (අ) සනුල් ෆර්නිචර් ව්‍යාපාරයේ ඍජු පිරිවැය හා වක්‍ර පිරිවැය 02 ක් උදාහරණ සහිතව දක්වන්න.
(ආ) සිද්ධිය ට අදාල මූලික සටහන් පොත් දෙකක් උදාහරණ සහිතව දක්වන්න.

vii. ලැලි සුමට කිරීමේ යන්ත්‍රය ක්ෂය කිරීම සම්බන්ධ ද්විත්ව සටහන ලියා දක්වන්න.

viii. සනුල් ෆර්නිචර් ව්‍යාපාරයේ 2025.01.31 දිනට මුදල් ශේෂය කොපමණ ද?

ix. 2025.01.31 දිනෙන් අවසන් මාසය සඳහා ශුද්ධ ලාභය ගණනය කරන්න.

x. 2025.01.31 දිනට සනුල් ෆර්නිචර් ව්‍යාපාරයේ හිමිකම ගණනය කරන්න. (ලකුණු 2*10)

1 කොටස - ව්‍යාපාර අධ්‍යයනය
(ප්‍රශ්න දෙකක ට පමණක් පිළිතරු සපයන්න)

2. i. ලාභ අපේක්ෂිත ව්‍යාපාරවල පොදුවේ දැකිය හැකි ව්‍යාපාර අරමුණු 02 ක් ලියන්න. (ලකුණු 02)

ii. **පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.**
(අ) අවශ්‍යතා මෙන්ම වුවමනා ද නිසගයෙන් උත්පාදනය වේ.
(ආ) ජාත්‍යන්තර සබඳතා රටක ආර්ථික පරිසරයට අයත් සාධකයක් වේ.
(ඉ) ශ්‍රී ලංකා රතුකුරුස සංවිධානය සේවා සපයන ව්‍යාපාරයකි.
(ඊ) අමාත්‍යාංශයක් යටතේ ක්‍රියාත්මක වන මුලුමනින්ම රජයේ ඍජු පාලනයට අයත්වන ආයතන දෙපාර්තමේන්තු නොවේ. (ලකුණු 02)

iii. තමාගේ ඉතුරුම් තැන්පතු මුදලක් යොදා බිම්මල් ව්‍යාපාරයක් කරගෙන යන බිසෑදි තම ව්‍යාපාර කටයුතු පහසු කරවා ගැනීම සඳහා සේවකයින් දෙදෙනෙකු බඳවා ගන්නා ලදි. ඇයගේ නිෂ්පාදිත ප්‍රදේශයේ පාරිභෝගිකයන් විසින් මිලදී ගනී.
(අ) ඉහත සිද්ධියට අදාළව ව්‍යාපාර පරිසර දෙකක් නම් කර උදාහරණයක් බැගින් දෙන්න.
(පිළිතුරු ලිවීම සඳහා පහත ආකාරයේ වගුවක් භාවිතා කරන්න.)

ව්‍යාපාර පරිසරය	උදාහරණ
1.	
2.	

(ලකුණු 02)

iv. සහන් විසින් විශාල ඇට සහිත රටකජු **සහන රට කජු** නමින් පැකට් අලෙවි කර යි. තම අස්වැන්නෙන් කොටසක් ප්‍රදේශයේ පවතින සමුපකාර සමිති වලට ද ලබා දෙයි.
(අ) ඉහත සිද්ධියට අදාළව, අරමුණු අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කර දක්වන්න.
(ආ) ඉහත වර්ගීකරණයට අනුව සිද්ධියට අදාළව උදාහරණය බැගින් ලියන්න. (ලකුණු 02)

3. i. සිල්ලර වෙළඳාමේ ලක්ෂණ දෙකක් දක්වන්න. (ලකුණු 02)

ii. පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.
(අ) චෙක්පතක් ලියා අත්සන් කරන්නා ණයකරු වේ.
(ආ) රක්ෂණ ආවරණය ලබන පාර්ශවය හෙවත් රක්ෂිතයා දෙවන පාර්ශවය වේ.
(ඉ) සුදුසු සන්නිවේදන මාධ්‍යයක් තෝරා ගැනීමේ දී පිරිවැය සලකා බලනු ලැබේ.
(ඊ) ප්‍රවාහන මූලිකාංග ලෙස මහාමාර්ග, දුම්රිය මාර්ග, ජලමාර්ග හා ගුවන් මාර්ග දැක්විය හැකිය. (ලකුණු 02)

iii. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳ ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩමුළුවක් සැප්තැම්බර් මස 13 වන දින පෙ.ව 9.00 ට පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු ප්‍රධාන ශාලාවේ දී පවත්වන බව දන්වා අධ්‍යාපන අධ්‍යක්ෂතුමා සියළුම පාසල් විදුහල්පතිවරුන් වෙත නිල වක්‍ර ලේඛයක් යොමු කරන ලදී.
(අ) ඉහත සිද්ධියට අදාළ සන්නිවේදන මාධ්‍ය සඳහන් කොට උදාහරණයක් දෙන්න.
(ආ) එම සිද්ධියට අදාළ ප්‍රතිචාරය කුමක් විය හැකි ද? (ලකුණු 02)

iv. දුම්රිය එන්ජින් අංගනයෙන් ඩීසල් ඉන්ධන පුරවා සතියේ සෑම දිනකම අළුයම 5.30 ට කොලඹ කොටුව දුම්රියපොළින් ගමන් අරඹන සුඛෝපභෝගී ඉන්ටර්සිටි දුම්රිය කංකසන්තුරේ බලා පිටත් වෙයි. ප්‍රවාහන මූලිකාංගය වන මාර්ගය, මාධ්‍යය, බලය සහ පර්යන්තය සඳහා නිදසුන් සහත සිද්ධිය ඇසුරෙන් වෙන වෙනම ලියන්න. (ලකුණු 02)

4. i. දේපල මිලදී ගැනීමෙන් පුද්ගලයෙකුට ලැබෙන ප්‍රතිලාභ දෙකක් ලියන්න. (ලකුණු 02)

ii. පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න

(අ) ව්‍යාපාර අරමුණු පේක්ෂිත අයුරින් ඉටු කර ගැනීම සඵලදායකත්වය වේ.

(ආ) අවුරුදු පහට අඩු දරුවන් සඳහා විශේෂිත කිරිපිටි වර්ගයක් නිපදවීම ඉලක්ක වෙළඳ පොළට නිදසුනකි.

(ඉ) කොළඹ කොටස් වෙළඳපොළ කටයුතු අධීක්ෂණය හා විධිමත් කිරීමට කොළඹ භූවමාරුව පිහිටුවා ඇත.

(ඊ) ආයෝජනය කළ මුදල ආපසු ලැබීම සම්බන්ධයෙන් පූර්ණ රාජ්‍ය ආරක්ෂාවක් භාණ්ඩාගාර බිල්පත්වලට ඇත. (ලකුණු 02)

iii. සූරිය ආහාර නිෂ්පාදන සමාගම විසින් නිෂ්පාදනය කරනු ලැබූ ෆෙෂ් අප් (Fresh up) නමින් පලතුරු බීම වර්ගයක් වෙළඳපොළට හඳුන්වා දුන්නේය. ඔවුන් මෙම නිෂ්පාදනය සාර්ථකව වෙළඳපොළට නිකුත් කිරීම සඳහා පහත පියවරයන් අනුගමනය කළේය.

A බීම බෝතලයක් රු. 150 කට අලෙවි කිරීමට තීරණය කිරීම.

B බීම බෝතල්වල කල් ඉකුත්වීමේ දිනය හඳුනා ගැනීමෙන් පසු අලෙවියේදී 10% ක වට්ටමක් ලබා දීම.

C සුපිරි වෙළඳසැල් 10 ක් සඳහා නිෂ්පාදනය බෙදා හැරීමට අවශ්‍ය ප්‍රවාහන සේවාවන් සහ ගබඩා පහසුකම් සූදානම් කිරීම.

ඉහත එක් එක් පියවරෙහි සඳහන් වන කළමනාකරණ ක්‍රියාවලියේ කාර්යය සහ අලෙවිකරණ මිශ්‍රණයේ විචල්‍ය ලියන්න. (පිළිතුරු සැපයීම සඳහා පහත ආකාරයේ ආකෘතියක් භාවිතා කරන්න. පළමු පියවර A සටහන් කර දක්වා ඇත.

පියවර	කළමනාකරණ කාර්යය	අලෙවිකරණ මිශ්‍රණයේ විචල්‍ය
A		
B		
C		

(ලකුණු 02)

iv. විද්මල් සතු රු 150 000 කොටස් වෙළඳපොලේ සාමාන්‍ය කොටස් මිලදී ගැනීමට සහ රු 200 000 ක් භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනය කරන ලදි.

(අ) ඉහත ආයෝජන වලින් අවධානම වැඩිම ආයෝජන මාර්ගය දක්වන්න.

(ආ) ඉහත එක් එක් ආයෝජන මාර්ගවලින් විද්මල්ට ලැබෙන ප්‍රතිලාභය නම් කරන්න. (ලකුණු 02)

11 කොටස - ගිණුම්කරණය

(ප්‍රශ්න දෙකක ට පමණක් පිළිතුරු සපයන්න)

5. i. ආදායම යනු කුමක්ද? (ලකුණු 02)

ii. පහත සඳහන් අයිතම වත්කම්,වගකීම්,හිමිකම්, ආදායම් හා වියදම් යන ශීර්ෂ යටතේ වර්ග කරන්න.

(අ) බැංකු ණය (ආ) විකුණුම්

(ඉ) මෝටර්රථ අළුත්වැඩියා වියදම් (ඊ) ගැනිලි (ලකුණු 02)

iii. (අ) ගිහාන්ගේ ව්‍යාපාරයේ සිදුවුණු ගනුදෙනු 2 ක්, ව්‍යාපාරයේ ගිණුම්කරණ සමීකරණයට බලපෑ ආකාරය පහත දැක්වේ.

දිනය	ගනුදෙනුව	වත්කම්	= හිමිකම්	+ වගකීම්
2025.10.01	01	+50 000(බඩු තොගය) -50 000(මුදල්)		
2025.10.02	02	-30 000(බඩු තොගය) + 35 000(ණයගැතියෝ)	+ 5000(ලාභය)	

ඉහත සඳහන් ගනුදෙනු දෙක වටිනාකම් සහිතව ලියන්න. (ලකුණු 02)

(ආ) නිලන්තිගේ ව්‍යාපාරයේ 2024 වර්ෂයට අදාළ තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

2024.01.01 දිනට ප්‍රාග්ධනය	රු. 600000
වර්ෂය තුළ ආදායම්	රු. 150000
වර්ෂය තුළ වියදම්	රු. 100000
වර්ෂය තුළ නිලන්තිගේ ව්‍යාපාරයට යෙදූ මුදල්	රු. 56000
වර්ෂය තුළ නිලන්තිගේ ව්‍යාපාරයෙන් ලබා ගත් භාණ්ඩ	රු. 10000

2024.12.31 දිනට නිලන්තිගේ හිමිකම ගණනය කරන්න. (ල.02 යි)

iv. ජයමාල්ගේ ව්‍යාපාරයේ 2025.11.01 දිනට මුදල් ගිණුමේ ශේෂය රු 80000 කි. නොවැම්බර් මාසය තුළ සිදු වූ ගනුදෙනු කිහිපයක් පහත දැක්වේ.

* 2025.11.02 ණයගැති නිමන්තගෙන් රු 16000 ක් අඩුකළ වට්ටම 10% කි.
* 2025.11.08 ණය හිමි සහන්ට රු 8000 ක් ගෙවීමේ දී ලද වට්ටම 400 කි.
* 2025.11.20 සේවක වැටුප් රු 40000 ක් ගෙවන ලදි.
* 2025.11.25 අත්පිට විකිණුම් රු 30000 කි . අවශ්‍ය වන්නේ ,ජයමාල්ගේ ව්‍යාපාරයේ වට්ටම් තීරු සහිත මුදල් පොත පිළියෙල කර 2025.11.30 දිනට මුදල් ශේෂය දැක්වීම. (ල.04 යි)

06. i. බැංකු අයිරාව යනු කුමක්ද? (ල.02 යි)

ii. පහත සඳහන් ගනුදෙනු සටහන් කරනු ලබන මූලික සටහන් පොත සඳහන් කරන්න.
(අ) රු 20000 ක ගෙවල් කුලී ගෙවීම.

(ආ) ව්‍යාපාරයේ කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා රු 200000 ක පරිගණක යන්ත්‍රයක් ණය පදනම මත මිලදී ගැනීම. (ල.02 යි)

iii. (අ) අමුරෙදි බෑග් නිෂ්පාදනය කරන ආයතනයක 2025 ඔක්තෝම්බර් මාසයට අදාළ තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

* මුළු නිෂ්පාදන පිරිවැය	රු 400000
* නිෂ්පාදනය කළ බෑග් ඒකක පිරිවැය	රු 800
* සෘජු ද්‍රව්‍ය පිරිවැය	රු 100000
* සෘජු ශ්‍රම පිරිවැය	රු 100000
* නිෂ්පාදන පොදු කාර්යය පිරිවැය	රු 150000

ඉහත තොරතුරු ඇසුරෙන් පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න. (ල.02 යි)

ප්‍රාථමික පිරිවැය	.....
නිෂ්පාදනය කළ බෑග් සංඛ්‍යාව	.....

Past Papers Wiki

(ආ) බුද්ධිනීගේ ව්‍යාපාරයේ ආධුනික ගිණුම් ලිපිකරු විසින් ගනුදෙනු කිහිපයක් ගිණුම්ගත කර ඇති ආකාරය පහත දැක්වේ. ඒවා අධ්‍යයනය කර ගිණුම් තැබීමේ දී සිදු වී ඇති වැරදි නිවැරදි කිරීමේ ජ'නල් සටහන් ලියන්න.

මුදල් ගිණුම

දිනය	විස්තරය	ස.පි	වටිනාකම	දිනය	විස්තරය	ස.පි	වටිනාකම
2025.11.01	ගැනුම් ගිණුම		47000				

ගැනුම් ගිණුම

දිනය	විස්තරය	ස.පි	වටිනාකම	දිනය	විස්තරය	ස.පි	වටිනාකම
				2025.11.01	මුදල් ගිණුම		47000

ලී බඩු ගිණුම

දිනය	විස්තරය	ස.පි	වටිනාකම	දිනය	විස්තරය	ස.පි	වටිනාකම
2025.11.08	මුදල් ගිණුම		60000				

(ල.02 යි)

iv. නිර්මාල්ගේ ව්‍යාපාරයේ 2025 අගෝස්තු 31 දිනට බැංකු ගිණුමේ වාසිදායක ශේෂය රු 73000 කි. එදිනට බැංකු ප්‍රකාශනයේ ශේෂය රු 48000 ක් විය. වෙනසකට බලපෑ හේතු පහත පරිදි වේ.

1. බැංකුව අයකරගෙන ඇති බැංකු ගාස්තුව රු 4000 කි.
2. ස්ථාවර නියෝග මත ගෙවූ ණය වාරිකය රු 12000 කි.
3. බැංකුවට ගෙවීම සඳහා ඉදිරිපත් නොවූ 014802 අංක දරණ රු 14000 ක චෙක්පත
4. අගෝස්තු මස 29 දින තැන්පත් තුළ අංක 033401 හා රු 23000 චෙක්පත උපලබ්ධි වීනැත.

අවශ්‍ය වන්නේ,

(අ) 2025 අගෝස්තු 31 දිනට නිර්මාල්ගේ ව්‍යාපාරයේ සංශෝධිත බැංකු ගිණුම

(ආ) 2025.08.31 දිනට බැංකු සැසඳුම් විස්තරය පිළියෙල කිරීම. (ල.04 යි)

07. i. බොල් ණය යනු කුමක්ද? (ල.02 යි)

ii. පහත දැක්වෙන්නේ දිරිශක්ති යෞවන සමිතියේ ලැබීම් හා ගෙවීම් ගිණුම යි.

දිරිශක්ති යෞවන සමිතිය

2024.12.31 දිනෙන් අවසන් වන වසර සඳහා ලැබීම් හා ගෙවීම් ගිණුම

ශේෂය ඉ/ගෙ	21000		ගොඩනැගිලි කුලී ගෙවීම	10000
සාමාජික මුදල්	15000		උපකරණ මිගදී ගැනීම	24000
පරිත්‍යාග	14000		විදුලි ගාස්තු ගෙවීම	8000
සංදර්ශන ආදායම්	30000			
			ශේෂය ප/ගෙ	38000
	80000			80000
ශේෂය ඉ/ගෙ	38000			

අතිරේක තොරතුරු

- සාමාජිකයින් 8 දෙනෙකු 2024 වර්ෂය සඳහා සාමාජික මුදල් ගෙවා නොමැති අතර වාර්ෂික සාමාජික රු 1000 කි.
- උපචිත ගොඩනැගිලි කුලී රු 2000 කි.

අවශ්‍ය වන්නේ - 2024 වර්ෂය සඳහා දිරිශක්ති යෞවන සමාජයේ ආදායම් ප්‍රකාශය පිළිලෙ කිරීම. (ල.02)

iii. සසිත්ගේ සිල්ලර වෙළඳ ව්‍යාපාරයේ 2024.12.31 දිනට ශේෂ පිරික්සුම් පහත දැක්වේ.

	හර (රු)	බැර(රු)
2024.01.01 දිනට තොගය	20000	
ගෙන ඒමේ කුලී	5000	
බෙදා හැරීමේ රථ පිරිවැය	600000	
බෙදාහැරීමේ රථ ක්ෂය වෙන් කිරීම (2024.01.01 දිනට)		60000
බැංකු ණය පොලී	11000	
8% බැංකු ණය		200000
මුදල් ශේෂය	18000	
බැංකු අයිරාව		21000
ලද වට්ටම්		4000
දුන් වට්ටම්	6000	
සේවක වේතන	35000	
විදුලි ගාස්තු	16000	
විකුණුම්		272000
ගැනුම්	100000	
ණය ගැනියෝ	33000	
ණය හිමියෝ		11000
ප්‍රචාරණ වියදම්	12000	
වරිපනම් ගාස්තු	4000	
ප්‍රාග්ධනය		300000
දුරකථන ගාස්තු	8000	
	868000	868000

අමතර තොරතුරු

- 2024.12.31 දිනට ඉතිරි තොගය 34000 කි.
- උපචිත දුරකථන ගාස්තු රු 5000 කි.
- බෙදාහැරීමේ රථ සරල මාර්ග ක්‍රමයට 10% බැගින් කල යුතුය.

අවශ්‍ය වන්නේ,

(අ) සසිත්ගේ සිල්ලර වෙළඳ ව්‍යාපාරයේ 2024.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශනය (ල.04 යි)

(ආ) 2024.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය (ල.04 යි)

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank